# සූරියවැව ප්‍රාදේශීය සභාව
# හම්බන්තොට දිස්ත්‍රික්කය
------------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 22 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 10 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 අහිතකර මතය
----------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට සූරියවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව මුළු ශුද්ධ වත්කම් වටිනාකම් හා වගකීම් වල වටිනාකම රු. 137,335,911 කට සමාන වන බව සාවද්‍ය ලෙස දක්වා තිබුණද මුළු ශුද්ධ වත්කම් වල නිවැරදි වටිනාකම රු.134,937,042 ක් හා මුළු ශුද්ධ වගකීම්වල එකතුව රු. 128,247,902 ක් වූයෙන් මුළු ශුද්ධ වත්කම් හා වගකීම් අතර රු. 6,689,140 ක වෙනසක් විය.

(ආ) ප්‍රධාන ලෙජරයේ පවත්වා තිබූ සමුච්චිත අරමුදල් අධිකතා හා ඌනතා ගිණුමේ මුළු බැර ශේෂයේ නිවැරදි වටිනාකම රු. 13,892,227 ක් වුවද සදොස් ලෙස රු. 22,980,235 ක් ලෙස පෙන්නුම් කර තිබුණි. වර්ෂය අවසානයට සමුච්චිත අරමුදල් අධිකතා හා ඌනතා ගිණුමේ නිවැරදි බැර ශේෂය රු. 3,422,934 ක් වුවත් එය ලෙජර් ගිණුමේ රු. 12,510,942 ක් ලෙස රු. 9,088,008 ක් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.

(ඇ) වර්ෂය ආරම්භයට පොදු ණයගැතියන්ගේ රු.2,520,250 ක ශේෂය ලෙජර ගිණුමේ ආරම්භක ශේෂයක් ලෙස ඉදිරියට ගෙන ඒම වෙනුවට කර්මාන්ත ණයගැති ගිණුමට මෙම මුදල බැර කර පොදු ණයගැති ගිණුම හර කිරීම නිසා කර්මාන්ත ණයගැතියන්ගේ වටිනාකම රු. 2,520,250 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂය අවසානයට ණයගැතියන් යටතේ වෙන්කිරීම් කර තිබූ පළාත් නිශ්චිත ප්‍රතිපාදන වලට අදාල කර්මාන්ත 02 ක් සඳහා 2014 අගෝස්තු 12 දින රු.1,080,310 ක මුදලක්ද මහනැගුම ප්‍රතිපාදන වලට අදාල කර්මාන්ත 02 ක් සඳහා 2014 දෙසැම්බර් 19 දින රු. 495,000 ක මුදලක්ද ලැබී තිබූ අතර එම මුදල කර්මාන්ත ණයගැති ගිණුමට බැර කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ප්‍රාග්ධන ආධාර ගිණුමට ඇතුලත් කර තිබුණි.

(ඉ) සේවක ඇප තැන්පත් ආයෝජන මුදල් සඳහා ලැබී තිබූ රු. 19,789 ක පොලී මුදල සේවක ඇප තැන්පත් වගකීම් ගිණුමට රු. 131,500 ක් ලෙස බැරකිරීමෙන් රු. 111,711 ක් වැඩියෙන් එම ගිණුම බැරවී තිබුණි.

(ඊ) එකතුව රු. 582,694 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 07 ක වටිනාකම සමාලෝචිත වර්ෂය තුල ප්‍රාග්ධනිත කර නොතිබූ අතර රථ වාහන අංගනය ඉදිකිරීම සඳහා වැයකර තිබූ රු. 661,245 ක මුදලින් රු. 377,740 ක් පමණක් ප්‍රාග්ධනිත කර තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

ජර්නල් සටහන් හතක් මගින් සමුච්චිත අරමුදලට සටහන්කර ඇති රු. 10,469,294 ක් වූ හර කිරීම් හා රු. 1,744,168 ක් වූ බැර කිරීම් වලට අදාල උපලේඛන විස්තර හෝ පැහැදිලි කිරීම් කිසිවක් විගණනයටද ඉදිරිපත් නොවුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,026,432 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම් ඉක්මවූ ආදායම රු. 1,445,876 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු.' 000 | රු. '000 |
| i. | වරිපනම් හා බදු | 1,937 | 755 | - |
| ii. | බදු කුලී | 20,948 | 8,908 | 1,429 |
| iii. | බලපත්‍ර ගාස්තු | 1,881 | 1,970 | 19 |
| iv. | වෙනත් ආදායම් | 63,129 | 43,275 | 19,722 |

#### 2.2.2 බදුකුලී

**(අ) සතිපොළ බදු දීම**

සභාවට අයත් සූරියවැව සහ වෙනිවැල්ආර සති පොළවල් 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 177 ප්‍රකාර ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කර නොතිබුණි. 2014 මාර්තු 07 දිනැති ලිපිය මඟින් 2014 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා මාස 09 ක කාල පරිච්ඡේදයක් සඳහා සූරියවැව සතිපොල රු. 9,000,000 කට බදු ගැනීම සඳහා බදුකරුවකු විසින් ඉල්ලුම් කර තිබුණද ඒ කෙරෙහි සැලකිල්ලක් දක්වා නොතිබුණි.සභාව විසින් 2014 වර්ෂය තුල සූරියවැව සතිපොලෙන් එකතු කර තිබූ මුළු ආදායම රු. 6,843,554 ක් වූ අතර එයින් රු. 1,191,353 ක මුදලක් කොමිස් මුදල් ලෙස බදු එකතු කරන්නන් වෙත ගෙවා තිබුණි.

මෙම සතිපොල ඉල්ලුම්කරුවන් වෙත බදු දීමට ක්‍රියා කළේ නම් සභාව විසින් එකතු කරනු ලැබූ මුදලට වඩා විශාල මුදලක් අයකර ගැනීමට හැකිව තිබූ බව නිරීක්ෂණය විය.

**(ආ) ආදායම් අත්හැරීම සඳහා අනුමැතිය ලබා නොගැනීම**

---

2014 පෙබරවාරි 11 දින සිට මැයි 11 දින දක්වා මාස 03 ක කාලයක් නියඟ තත්ත්වය හේතුවෙන් ගොවි නිෂ්පාදන වලින් බදු අය නොකිරීමට 2014 පෙබරවාරි 11 දින රැස්වූ සභාව විසින් තීරණය කර තිබුණි.මෙම තීරණය නිසා මෙම කාල සීමාවට අදාලව අහිමි වී ඇති සාමාන්‍ය බදු ආදායම රු. 1,103,949 ක් වූ අතර රු.50 ට වැඩි ආදායම් අත්හැරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**(ඇ) කඩ කාමර බදු**

---

i. හිඟ කඩකාමර කුලී

---

2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 606,900 ක මුදලක් හිඟව පැවතියද මෙම හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

ii. එක්වන් මුදල් අය නොවීම

---

පළාත් පාලන කොමසාරිස්වරයාගේ 2011 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන දපපා/ පපාකො/2010 දරන චක්‍රලේඛයේ 4 ඡේදය අනුව එක්වන් මුදල් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට 2008 වර්ෂයේ සිට හිඟව පැවති එකතුව රු. 822,362 ක එක්වන් මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

iii. බදුකරුවන් වෙත නියමිත දිනට කඩකාමර ඉදිකිරීම් කර භාර නොදීම

---

'සූරියවැව සිඟිති උයන' නැමති භූමියෙහි කඩ කාමර 4 ක් ඉදිකර ලබාදීම සඳහා 2010 ජූලි 30 දින ටෙන්ඩර් කැඳවීම් සිදු කර වැඩිම මිළකට ඉල්ලුම් කළ ටෙන්ඩර් කරුවන් 4 දෙනෙකුගෙන් එකතුව රු. 1,025,000 ක මුදලක් ලබාගෙන තිබුණි. මුදල් ගෙවීමෙන් පසු මාස 03 ක් තුල කඩකාමර ලබාදීමට කටයුතු කරන බවට එකඟවී තිබුණද ඒ අනුව කටයුතු නොකිරීම නිසා ටෙන්ඩර්කරුවන් විසින් 2013 පෙබරවාරි 18 දින සභාවට එරෙහිව නඩු පවරා තිබුණි. කඩකාමර 4 හි ඉදිකිරීම් කටයුතු 2014 දෙසැම්බර් 31 දින වන විටත් නිමකර

නොතිබුණු අතර එකඟ වූ කොන්දේසි අනුව කඩකාමර ඉදිකර නොදීම හේතුවෙන් නඩු ගාස්තු ලෙස එකතුව රු. 102,000 ක මුදලක් සභාවට ගෙවීමට සිදුව තිබුණි.

**2.2.3** බලපත්‍ර ගාස්තු

----------------

2014 දෙසැම්බර් 31 දිනට හිඟ බලපත්‍ර ගාස්තු රු. 73,450 ක මුදලක් අයකර ගැනීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 හා 150 (4) වගන්ති ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.2.4** උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 1,847,939 ක මුදලක් උසාවි දඩ හා මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතුව තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1** **හඳුනාගත් අලාභ**

------------------

යෝජිත කොම්පෝස්ට් ව්‍යාපෘති සඳහා මිළදී ගෙන තිබූ භාණ්ඩ වලින් කොටසක් නැතිවී තිබූ අතර එම නැතිවීමට අදාලව වගකිව යුතු පාර්ශවයන්ගෙන් රු.101,500 ක මුදලක් අයකර ගත යුතු බවට ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 104 නියමය පරිදි 2013 ජූලි 09 දින නිර්දේශ කර තිබුණද විගණන දිනය වූ 2015 මාර්තු 03 දින වන විටත් එම මුදල් අයවී නොතිබුණි.

**3.2** **කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

(අ) 2014 ජූලි 02 දිනැති අංක MPH/HYW/MNG/Cer/14-1 දරන මහාමාර්ග,වරාය හා නාවික අමාත්‍යාංශ ලේකම්වරයාගේ ලිපියේ 01 ඡේදය අනුව මඟනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන මාර්ග සඳහා අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේදී අමුද්‍රව්‍ය මත එකතු කරනු ලබන 10% ක අමතර පිරිවැය එකතු නොකර ඇස්තමේන්තු සකස් කරන ලෙස දක්වා තිබුණද සභාව විසින් ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 11 ක් සඳහා එසේ කටයුතු නොකිරීම හේතුවෙන් එකතුව රු. 52,146 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) සභාව විසින් ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 06 ක් සම්බන්ධයෙන් 2015 මාර්තු 02 හා 03 යන දිනයන්හි සිදුකළ භෞතික පරීක්ෂාවේදී මාර්ගයේ දෙපස ඉදිකර තිබූ කොන්ක්‍රීට් ගැට, හැඩයම් වැඩ හා ගල්කුඩු යන කාර්යයන්ට අදාලව එකතුව රු.394,084 ක මුදලක් වැඩිපුර ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

## 3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

ප්‍රාදේශීය සභාව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා භූමිය තෝරා ගැනීම හා දැල්වැට ඉදිකිරීම සඳහා අවශ්‍ය භාණ්ඩ මිළදී ගැනීම පමණක් සිදුකර තිබූ අතර වැට ඉදිකිරීම සඳහා 2011 දෙසැම්බර් 30 දින රු. 1,065,900 ක් වැයකර මිළදීගත් භාණ්ඩ යොදාගෙන අදාල කාර්යය නිමකිරීමට 2014 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි.

## 4. පද්ධති හා පාලන

------------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය